// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2345/62 – 2023 අගෝස්තු 17 වැනි බ්‍රහස්පතින්දා – 2023.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2017/93.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.03.10 දිනැති හා අංක 2166/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.12.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රාජගිරිය, නාවල පාර, ලියනගේ මාවත, අංක 24/2 හි පදිංචි එන්. කේ. උපාලි රූපසිංහ මයා සහ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල හි පිහිටි ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.07.12 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 27 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදීය.

එන්. කේ. උපාලි රූපසිංහ
24/2,
ලියනගේ මාවත,
නාවල පාර, රාජගිරිය.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය - A/07/2020.
IR/COM/03/2017/93.

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල,
කටුනායක.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා ආරාවුල

නිපුණතා සංවර්ධන රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා IR/COM/03/2017/93 අංකය යටතේ 2019.12.26 දිනැති ලිපිය ප්‍රකාරව බේරුම්කරුවකු වශයෙන් විතාරණගේ ජයරත්න වන මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුලට තුඩු දුන් කාරණය වනුයේ,

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගතවී ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර මහතා විසින් 2019 දෙසැම්බර් මස 15 වැනි දිනැතිව එවා ඇති ලිපියේ දැක්වෙන්නේ,

''ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් හි සේවයේ නියුතු එන්. කේ. උපාලි රූපසිංහ මයා. හට

1. දීර්ඝ විදේශීය සේවා පළපුරුද්දක් සහිතව 1998.02.20 දින EV ශ්‍රේණියේ විධායක ඉංජිනේරුවරයකු ලෙස සේවයට එක්වී 2001.04.01 දින සිට 9 ශ්‍රේණියේ කළමනාකරුවෙකු ලෙස උසස්වීම ලැබීමෙන් අනතුරුව මේ දක්වා උසස්වීම් ලබා නොදීම.

2. සේවයට එක්වන අවස්ථාවේදී මාසිකව පෙට්‍රල් ගැලුම් 30 ක වටිනාකමට සමාන මුදලක් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ලබාදුන් වරප්‍රසාදය 1999.10.01 දින සිට කිසිදු දැනුම්දීමකින් තොරව අත්හිටුවීම.

3. 1999.11.23 දිනැති චක්‍රලේඛය මගින් ලබාදුන් 40% ක වැටුප් වැඩි කිරීම 20% බැගින් වාරික 2 කින් අනෙකුත් සියලුම සේවකයන්ට ලබා දුන්නද පැමිණිලිකරුට 20% ක පළමු වැඩිවීම පමණක් ලබා දී දෙවැනි 20% ක වැඩිවීම ලබා නොදීම.

4. පැමිණිලිකරුට සේවයට පැමිණි දින සිට ලබා දුන් රු. 5000/- ක පොරොත්තු දීමනාව (ON-Call Allowance) 2011.01.01 දින සිට අහිමි කිරීම යන කරුණු මගින් යම් අසාධාරණයක් සිදුවී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහන කවරේද?'' යන්නත් පිළිබඳව වේ.

මෙම නඩුව මින් පෙර අවස්ථාවකදී කම්කරු අමාත්‍ය හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් IR/COM/03/2017/93 සහ 2019.02.28 දිනැති ලිපිය මගින් මැණික්දිවෙල ශ්‍රී ජේමරතන මාවතේ අංක 22/1 හි එස්. ජී. සූරියාරච්චි මහතා වෙත A19/2019 අංක යටතේ යොමු කර ඇති අතර විභාගයට නියමිත කර තිබියදී ඔහුගේ අසනීප තත්ත්වය හේතුවෙන් එම පත්කිරීම අවලංගු කර මා වෙත යොමු කර ඇති බව ද නිරීක්ෂණය වේ.

**නඩු කාර්ය පටිපාටිය**

නව අංකය යටතේ දෙපක්ෂයෙන් ම නැවත ප්‍රථම ප්‍රකාශ කැඳවා හුවමාරු කර ඒවාට අදාළව දෙපක්ෂයෙන් ම දෙවන ප්‍රකාශයන් ද කැඳවීමෙන් පසුව දෙපක්ෂයේ සාක්ෂි කැඳවා හරස් ප්‍රශ්න ද විමසා අවසන් කළ පසු ලිඛිත දේශන ද කැඳවා සියල්ල විමර්ශනය කිරීමෙන් අනතුරුව මෙම ප්‍රදානය සැකසීමට පියවර ගන්නා ලදී.

පළමු පක්ෂය වෙනුවෙන් ඔහු පමණක් සාක්ෂි ලබාදෙමින් A1 සිට A9 දක්වා ලේඛන ලකුණු කර ඇති අතර දෙවන පක්ෂය වෙනුවෙන් සාරා මොහොමඩ් මහත්මියත් රෝෂණ නවින්ද වික්‍රමසිංහ මහතාත් සාක්ෂි දෙමින් R1 සිට R18 දක්වා ලේඛන ලකුණු කර ඇත.

පළමු පක්ෂය ආරාවුලට අදාළව සිය පළමු ප්‍රකාශය 2020.05.27 දින නඩු අංක A/19/2019 අප්‍රේල් දින මුද්‍රාව සහිත මුල් නඩුවට ගොනු කළ ප්‍රථම ප්‍රකාශයේ ඡායා පිටපතක් නොසැලකිලිමත් ලෙස ඇමුණුම් 1 සිට 5 දක්වා ඇති ලේඛන ද සමග ඉදිරිපත් කර ගොනු කර ඇති බව නිරීක්ෂණය වේ. දෙවන පක්ෂය 2020 ජූලි 15 දිනැති තම පළමු ප්‍රකාශය 2020 ජූලි 16 දින A/07/2020 අංකය යටතේ ලේඛන රහිතව ගොනු කර ඇත. ඊට අදාළව පළමු පක්ෂය නැවත උත්තර ප්‍රකාශයක් 2020 අගෝස්තු 18 දින ගොනු කර ඇත. ඊට ඇමුණුම් A සිට I දක්වා ලේඛන ද අමුණා ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

පළවන පක්ෂයේ දෙවන ප්‍රකාශයට පිළිතුරු වශයෙන් දෙවන පක්ෂය විසින් 2020 සැප්තැම්බර් 8 දින තම මුල් ප්‍රකාශයේ සඳහන් කරුණු නැවත තහවුරු කරමින් ද පළමු පක්ෂයේ පළමු ප්‍රකාශයේ සඳහන් සියලු කරුණු ප්‍රතික්ෂේප කරමින් ද 15% කින් සත්‍ය වැටුප් අඩු වී ඇති බව සහ පළමු පක්ෂය කෙරෙහි අසාධාරණ සහ අයුක්ති සහගත ලෙස සහ කම්කරු නීතීන්ට පටහැනිව කටයුතු කර ඇත යන්න ප්‍රතික්ෂේප කරමින් ද තම මුල් ප්‍රකාශයේ සඳහන් කරුණු යළිත් තහවුරු කරමින් ද සිය දෙවන ප්‍රකාශය ඉදිරිපත් කර ඇත.

**ප්‍රදානය**

මෙම පරීක්ෂණය සඳහා පළමු පක්ෂය විසින් 2020 මැයි මස 27 වැනි දින ඉදිරිපත් කර තිබූ පළමු ප්‍රකාශය 2020 අප්‍රේල් 30 දින ඇතිව සකසා ඇතත් 2019 අප්‍රේල් 30 දරන දින මුද්‍රාවක් සහ මැයි 27 දින මුද්‍රාවක් සහිතව පිටු අංක 01 සිට 12 දක්වා ප්‍රකාශය සහ 13 සිට 25 දක්වා ඇමුණුම් වශයෙන් 1 සිට 5 දක්වා ලේඛන ද සමග ගොනු කර ඇති බව නිරීක්ෂණය වේ. එසේම එහිදී බේරුම්කරණ අංකය වශයෙන් සඳහන් කර ඇත්තේ A/19/2019 වන අතර ඒ අනුව පළමු පක්ෂයේ නොසැලකිලිමත් බව සහ උදාසීන ස්වභාවය ද හෙළිදරව් වන බව පෙනේ. එසේම ඇමුණුම් 1 සිට ඇමුණුම් 5 දක්වා ලේඛන ඡායා පිටපත් වන අතර සත්‍ය පිටපත් බවට කිසිදු සහතික කිරීමක් කර නැති බව ද නිරීක්ෂණය වේ.

සාක්ෂි විමසීමේ දී ඒ පිළිබඳව දෙවන පක්ෂයේ නීතිඥ මහතා විරෝධතාවක් මතුකර නැත්තේ එකී ලේඛන පිළිබඳ ඔවුන් දන්නා හෝ පිළිගන්නා හේතුවෙන් බව සළකා දෙපක්ෂයේ පිළිගැනීම මත එම ලේඛන බේරුම්කරණය මගින් ද පිළිගැනීමට තීරණය කරමි.

දෙවන පක්ෂය විසින් ද සිය පළමු ප්‍රකාශය 2020 ජූලි 16 වැනි දින නීතිඥ ප්‍රසාද් සිල්වා මහතා විසින් 2020 ජූලි 15 වැනි දින අත්සන් කරන ලද ප්‍රකාශය 2020.07.16 දින බේරුම්කරණයට ඉදිරිපත් කර ඇති අතර ලේඛන රහිතව ගොනු කර ඇති බව නිරීක්ෂණය කරමි.

එම ප්‍රකාශය A19/2020 අංක දරන බේරුම්කරණ ගොනුවට ඉදිරිපත් කරන ලද ලේඛනයම වන අතර 2020 ජූලි 15 දිනැතිව 2020 ජූලි 16 දින ලේඛන රහිතව අවශ්‍ය වෙනස් කිරීම් සිදුකර ඉන්පසුව බේරුම්කරණයට ඉදිරිපත්කර ඇති බව නිරීක්ෂණය වේ.

ඉන් අනතුරුව පළමු පක්ෂය වන රූපසිංහ මහතාගේ ම අත්සනින් 2020 අගෝස්තු 18 දින 2020 අගෝස්තු 17 දින ඇති පිළිතුරු ප්‍රකාශයක් ඇමුණුම් A සිට I දක්වා ලේඛන ඡායා පිටපත් සමග ගොනු කර ඇති අතර කිසිදු ලේඛනයක් සත්‍ය පිටපතක් බවට සහතික කිරීමකින් තොරව ඉදිරිපත් කර ඇති බව ද නිරීක්ෂණය වේ. ඊට පිළිතුරු වශයෙන් නීතිඥ ප්‍රසාද් සිල්වා මහතා විසින් දෙවන ප්‍රකාශයක් ලේඛන රහිතව පළමු පක්ෂයේ කරුණු ප්‍රබල ඔප්පු කිරීමට යටත් කරමින් ද තම මුල් ප්‍රකාශයේ කරුණු යළි තහවුරු කරමින් ද ලේඛන රහිතව ගොනු කර ඇත.

එහිදී පළමු පක්ෂයේ දෙවැනි ප්‍රකාශයේ අඩංගු කරුණු පොදුවේ ප්‍රතික්ෂේප කිරීම හැර ඒ පිළිබඳව වෙනත් කිසිවක් සුවිශේෂයෙන්ම සඳහන් කර නැත.

නඩු ප්‍රමාදවීම වළක්වා ගනු වස් සහ එංගලන්තයේ සිට පළමු පක්ෂය නඩුවට පැමිණෙන නිසාත් මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයක් මගින් ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳව බේරුම්කරණයෙන් කළ විමසීමට අනුව පළමු පක්ෂයේ මූලික සාක්ෂි දිවුරුම්

ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කිරීමට එකඟ වූ අතර 2021 වසරේ පෙබරවාරි 4 වැනි දින ඇතිව 2021 පෙබරවාරි 8 දින බේරුම්කරණයට සිය දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. දිවුරුම් ප්‍රකාශය ගොනු කිරීමේදී මුල් ප්‍රකාශ සමග ලේඛන ලකුණු කළ ක්‍රමය අතහැර වෙනස් ම ආකාරයකින් A1 සිට A9 දක්වා ලේඛන නමයක් ගොනු කර ඇතත් ඒවා සත්‍ය පිටපත් බවට සහතික කිරීමකින් තොරව ඡායා පිටපත් ඉදිරිපත් කර ඇති බව ද නිරීක්ෂණය කරමි. පාර්ශ්වකරුවන් හෝ නීතිඥ මහතුන් ඒ පිළිබඳව විරෝධතාවයක් නොපෑ අතර එම ලේඛන අනුව විමසීම් ආරම්භ කිරීමට තීරණය කරන්නට යෙදුණි.

පළමු පක්ෂය මුල් අවස්ථාවේදී ඇමුණුම් 1 සිට 5 දක්වා ලේඛන ලකුණුකර ඇති අතර දෙවන පක්ෂයේ පිළිතුරු ප්‍රකාශයට එරෙහිව ගොනු කළ දෙවන පිළිතුරු ප්‍රකාශයේදී පළවන පක්ෂය A සිට I දක්වා ලේඛන ලකුණු කර ඉදිරිපත් කර ඇති බව ද නිරීක්ෂණය වේ.

එසේම මුල් මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයකින් ඉදිරිපත් කිරීමේ දී පළමු පක්ෂය ඉහත ක්‍රම දෙකෙන් ම බැහැරව A1 සිට A9 දක්වා වෙනස්ම ආකාරයකින් ලේඛන ලකුණු කර ඉදිරිපත් කර ඇති බව ද නිරීක්ෂණය වේ. පළමු පක්ෂය අපිළිවෙලින් විවිධ අවස්ථාවන්වලදී නීතිඥ සහායකින් තොරව වෙනස් වෙනස් ආකාර අනුව නොසැළකිලිමත්ව ලේඛන ලකුණු කර ඇති වව නිරීක්ෂණය වන අතර සාක්ෂි ලබාදීමේ දී ඔහුගේ සාක්ෂි මෙහෙයවීම සඳහා පැමිණි නීතිඥ මෛත්‍රී පිටවල මහතා මුල් අවස්ථාවේදී ලකුණු කළ ලේඛන පිළිබඳ සඳහන් කිරීමකින් තොරවම A1 සිට A9 දක්වා ලේඛන පිළිබඳ පමණක් විමසා මූලික සාක්ෂි අවසන් කරන ලදී.

මේ අනුව විවිධ අවස්ථාවල ඉදිරිපත් කර ඇති අනෙකුත් ඉහත කී ලේඛන මෙම පරීක්ෂණයේ දී නොසළකා හරින ලද බව ද මූලික සාක්ෂියේ දී සඳහන් ලේඛන පමණක් අවුල් සහගත බව වළකා ගැනීම වස් සැළකිල්ලට ගැනීමට තීරණය කරමි.

EV ශ්‍රේණියේ ඉංජිනේරුවරයෙකු වශයෙන් 1998.02.20 දින සිට සේවය ආරම්භ කළ පළමු පක්ෂය අවුරුදු තුනකට පමණ පසුව 2002 අප්‍රේල් මස 1 වැනි දින සිට 9 වන ශ්‍රේණියේ කළමනාකාර තත්ත්වයට උසස් කර ඇති අතර එතැන් පටන් කිසිදු උසස්වීමක් නොලබා 2019 දෙසැම්බර 15 වැනි දින දක්වා එම ආයතනයේ සේවය කර ඇති බව පළමු පක්ෂය පිළිගනී.

2019 වර්ෂයේ තමා විශ්‍රාම ගත් හෙයින් පළවන විසඳුමට අදාළව කිසිදු ඉල්ලීමක් නොකරන බවට බේරුම්කරණය වෙත ගොනු කළ ලිඛිත සැළකිරීමේ දී පළමු පක්ෂය පැහැදිලිව දක්වා ඇති හෙයින් මෙම පරීක්ෂණයේදී විමසා බැලිය යුතු විසඳනා පහත සඳහන් විසඳනා වන් වන 2, 3 සහ 4 යන විසඳනාවන් පමණක් බවට තීරණය කරමි.

**දෙවන විසඳනාව**

ඉහත කරුණු අනුව විසඳිය යුතු පළවෙනි කරුණ වන්නේ සේවයට එක්වන අවස්ථාවේදී මාසිකව පෙට්‍රල් ගැලුම් 30 ක් වටිනාකම ප්‍රතිපූරණය කරගැනීමට පැවති වරප්‍රසාදය 1999 ඔක්තෝබර් පළවන දින සිට පූර්ව දැනුම් දීමකින් තොරව අත්හිටුවීම යන්නයි.

ඉහත කී ප්‍රතිපූරණයට අදාළව කිසිදු සඳහනක් පත්වීම් ලිපියේ නැති බව දෙපක්ෂය ම පිළිගෙන ඇත. එසේම හරස් ප්‍රශ්න විමසීමේ දී පළමු පක්ෂය විසින් පිළිතුරු දී ඇත්තේ පහත පරිදි වේ.

ප්‍ර: විධායක ශ්‍රේණියේ නිලධාරියෙකුට විශේෂයෙන්ම කිව්වේ නැත්නම් එවැනි ඉන්ධන දීමනාවක් ප්‍රතිපූරණය කරන්න සිදු වෙන්නේ නැහැ නේද?

පි: ඒ ගැන මම දන්නේ නැහැ

ප්‍ර: තමා ආයතනයේ සේවයට බැඳිලා ටික දවසක් යනකොට තමා මෙම ඉන්ධන ප්‍රති පූරණය කිරීමේ දීමනාව තවදුරටත් නොලැබුණාට තමාගේ ප්‍රවාහනය සම්බන්ධයෙන් කිසියම් වැඩ පිළිවෙළකට සහභාගි වුණා නේද?

පි: ආයතනයේ කළමනාකරණ ශ්‍රේණිය දක්වා හිටපු නිලධාරීන්ට ආයතනය සපයන පොදු ප්‍රවාහන පහසුකම් භාවිතා කිරීමේ හැකියාව තිබෙනවා. ඒ පහසුකම් ඒ විදියටම භාවිතා කරගෙන යන ගමන් මේ ප්‍රවාහන දීමනාව මට ලැබෙන්නේ මගේ සම්මුඛ පරීක්ෂණයේදී කරන ලද සාකච්ඡාවක් හැටියට. ඒ තුළ තමයි මට ප්‍රවාහන දීමනාව ලැබෙන ගමන් පොදු ප්‍රවාහන සේවයේ එන්නත් පුළුවන්. එහෙම නැත්නම් මගේ කාර් එකෙන් එන්න පුළුවන්.

ඉහත ප්‍රකාශ අනුව පොදු ප්‍රවාහන සේවය භාවිතා කරන ගමන් ඉන්ධන දීමනාව ගන්නත් පුළුවන් බව පළමු පක්ෂය ප්‍රකාශ කර ඇත. එහිදී එකම පහසුකම් ද්විත්ව වීමක් වන බව පෙනේ. මන්ද ඔහුගේ තනතුර ඉංජිනේරු තනතුරක් වීම හේතුවෙනි. එම

තනතුරට අදාළ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් EV ශ්‍රේණියේ උපරිම වැටුප ඔහු ලංකා විදුලිබල මණ්ඩලයේ දී ලබා සිටි වැටුපට වඩා අඩු මට්ටමක පැවැතී ඇති බව සාක්ෂි අනුව පෙන්වන අතර එම අඩුව සම්පූර්ණ කිරීම සඳහා ඔහුට පෙට්‍රල් ගැලුම් තිහකට සමාන මුදලක් ප්‍රතිපූරණය කිරීමට ආයතනය තීරණය කර තිබීම හේතුවෙනි. එහෙත් 2001 වසර වන විට ඔහු නව වන ශ්‍රේණියේ කළමනාකාර තත්ත්වයට උසස් කරනු ලබන අතර එහිදී ඔහුට වෙනම ප්‍රවාහන දීමනාවක් සහ රුපියල් 6750 ක ඉන්ධන දීමනාවක් වැටුපට එකතු කර ගෙවනු ලබන හෙයින් පොදු ප්‍රවාහන සේවය භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවන අතර එම පෙට්‍රල් ගැලුම් 30 ක මුදල ප්‍රතිපූරණ කිරීම ද අවශ්‍ය නොවන බව පෙනී යයි.

එසේම ඉහත සියලු පහසුකම් ලබා ගන්නා අතරතුර නොමිලේ සැපයන බස් සේවය ද භාවිත කළ හැකි බව ද පළවන පාර්ශ්වය පිළිගෙන ඇත. ඒ අනුව එම විසඳනාවට අනුව කිසිදු අගතියක් පළමුවන පක්ෂයට සිදුවී නැති බව සහ දෙවන පක්ෂය උපරිම සාධාරණව කටයුතු කර ඇති බව ද පැහැදිලි වේ.

තනතුර උසස්වීමත් සමග වැටුප ද ඉහළ යන හෙයින් ගැලපීම් සඳහා ලබා දී තිබූ වරප්‍රසාද තවදුරටත් වලංගු නොවන අතර සාක්ෂි අනුව ද ඒ බව තහවුරු වේ. විදුලිබල මණ්ඩලයේ දී ලැබුණු වැටුප මෙම ආයතනයේ වැටුපට සමපාත කිරීම සඳහා පෙට්‍රල් ගැලුම් 30 ක මුදල ප්‍රතිපූරණය කළත් ඔහු නව වන ශ්‍රේණියේ කළමනාකාර තනතුරට 2001 වසරේ අප්‍රේල් 1 දින පත්වූ පසුව එම ප්‍රතිපූරණය කිරීමේ අවශ්‍යතාවය නැතිව යන බව සාක්ෂි අනුව තහවුරු වේ. ඒ එම තනතුරට ඉන්ධන දීමනාවක් වෙනම ගෙවූ නිසාවෙනි.

1999.06.01 දින සිට රු. 6750/- ප්‍රවාහන දීමනාවක් වැටුපට ගෙවා ඇති හෙයින් ප්‍රතිපූරණය කිරීමේ අවශ්‍යතාවක් මතුවන්නේ නැති බව පහත සඳහන් පළමු පක්ෂයේ ම සාක්ෂි අනුව තහවුරු වේ.

ප්‍ර: ඔය අත්හිටුවීම කළා කියන 1999.06.01 දින සිට තමාට ප්‍රවාහන දීමනාව වශයෙන් රු. 6750.00 ක් ආයතනයෙන් ගෙව්වා නේද?

පි: ඔව්
(ඒ අනුව පෙට්‍රල් ගැලුම් 30 ක දීමනාව වැටුපට එකතුකර ගෙවීම ආරම්භ කර ඇති බව සනාථ වේ)

ප්‍ර: 2001.04.02 දින සිට ඒක රු. 10,000 දක්වාත් වැඩි වුණා නේද?

පි: 1999.06.01 සිට රු. 16,000 දක්වා වැඩි කිරීමටත් එම දීමනාව වැටුප සමග සම්බන්ධ කර ගෙවීමටත් ආයතනය විසින් තීරණය කළා

ප්‍ර: රු. 16,000 ඇවිල්ලා තිබෙන්නේ ප්‍රවාහන දීමනාව ලෙස රු. 6000.00 යි ඉන්ධන දීමනාව ලෙස රු. 10,000.00 ලෙස නේද?

පි: එහෙම වෙන්න ඇති

ප්‍ර: ඊට පසුත් මේ රු. 16,000.00 ටත් වඩා වැඩි වුණා නේද?

පි: වෙන්න ඇති

ප්‍ර: තමා කොපමණ කාලයක් මේ දීමනාව ලබා ගත්තා ද?

පි: අවුරුදු එකහමාරක් පමණ

මෙහිදී කාලය නිශ්චිතව ප්‍රකාශ කර නැති බව ද පෙනී යයි.

එහෙත් වගඋත්තරකාර දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු සරා මොහොමඩ්ගේ සාක්ෂි අනුව

''නව වන ශ්‍රේණියට මේවා ඔක්කොම ඉබේම ලැබෙනවා ඒ ලැබෙන කොට මේක කොහොමත් නවතිනවා මේක ස්පෙෂල් එකක්නෙ'' යන ප්‍රකාශය අනුව ද එය තහවුරු වේ.

ප්‍ර: කිසියම් කාලයක දී එනම් 1999.10.01 වැනි දින සිට එම දීමනා අත්හිටුවීමට ආයතනය කටයුතු කළාද?

පි: මට හරියටම දින මතක නැහැ. එහෙම නැවැත්තුවා කියලා හිතනවා නම් මම කිව්වනේ එයාට 09 වන ශ්‍රේණිය හම්බ වුණා කියලා. 09 වන ශ්‍රේණියට මේ ඔක්කොම ඉබේම ලැබෙනවා. ඒ ලැබෙන කොට මේක කොහොමත් නවතිනවා. මේක ස්පෙෂල් එකක්නේ. මෙයාට දුන්නේ මේ ගැලුම් 30 කියන එක ස්පෙෂල් එකක් ඊ - 5 එකට දුන්නේ. මේ ඔක්කොටම කළමනාකරණ ශ්‍රේණියට වැටෙන කොට මේ ඔක්කොම ඉබේම නතර වෙනවා.
මේත් එක්කම තවත් එලවන්සස් තියෙනවා. එතකොට මේක ඉබේම නවතිනවා කියන එකයි මට කියන්න තියෙන්නේ.

ප්‍ර: මේක නතර වුණා කියලා පාඩුවක් වෙන්නේ නැහැ නේද?

පි: පාඩුවක් වෙන්නේ නැහැ. වෙනත් ක්‍රමයකින් හම්බ වෙනවා. ෆුඅල් එලවන්ස් කියලා ඒ වගේ නම්වලින් හම්බ වෙනවා.

ප්‍ර: ප්‍රවාහන දීමනා ඉන්ධන දීමනා කියලා හම්බ වෙනවා?

පි: ප්‍රවාහන දීමනා කියලා හම්බ වෙන්නේ නැහැ. 09 වන ශ්‍රේණියට ඉන්ධන දීමනා විතරයි හම්බ වෙන්නේ.

එහිදී R1 වශයෙන් ලකුණු කළ ලිපියේ නව වන ශ්‍රේණියට ලැබෙන දීමනා දක්වා ඇති බව කියා සිටී. ඒ අනුව සළකා බැලීමේදී මෙම දීමනා දෙකම ලැබෙන බව සනාථ වේ.

ඒ අනුව ඉන්ධන දීමනාව රුපියල් 10,000 කුත් ප්‍රවාහන දීමනාව රුපියල් 6000 කුත් බදුවලට යටත්ව රුපියල් 16,000 ක මුදලක් ලැබෙන බව සනාථ වේ.

09 වන ශ්‍රේණියට ලැබෙන දීමනා සාරා මොහොමඩ් ප්‍රකාශ කර ඇති අතර ඒවා ලැබෙන්නේ 2001 උසස්වීමත් සමගයි. එහෙත් ඉල්ලුම්කරුගේ ම පිළිගැනීම අනුව 132 පිටුවේ ප්‍රශ්න සහ පිළිතුරු අනුව 1999 ජුනි මස 01 වැනි දින සිට රුපියල් 6750 වැටුපට එකතු කර ගෙවා ඇති බව පෙනී යයි. ඒ අනුව ප්‍රතිපූරණය කිරීමේ අවශ්‍යතාවය ඒවනවිටත් නැති වී ඇති බව පැහැදිලිවම පෙනේ. ඉන් පසුව එකී ගෙවීම් රුපියල් 16000 දක්වා ඉහළ ගිය බව ද පිළිගෙන ඇත. ඒ අනුව දෙවන විසඳනාවට අදාළව කිසිදු අසාධාරණයක් පළමු පක්ෂයට සිදු වී නැති බව තීරණය කරමි. මෙම තීන්දුව සාධාරණ සහ යුක්ති සහගත තීන්දුවක් බවට ද ප්‍රකාශ කරමි.

මීළඟට සළකා බැලිය යුත්තේ තුන්වන විසඳනාව පිළිබඳවයි.

එනම් 1999.11.23 දිනැති චක්‍රලේඛය මගින් ලබා දුන් 40% ක වැටුප් වැඩි කිරීම 20% බැගින් වාරික 2 කින් අනෙකුත් සියලුම සේවකයන්ට ලබා දුන්නද පැමිණිලිකරුට 20% ක පළමු වැඩිවීම පමණක් ලබාදී දෙවැනි 20% ක වැඩිවීම ලබා නොදීම.

වගඋත්තරකරුගේ දෙවන සාක්ෂිකරු වන රෝෂන නවින්ද වික්‍රමසිංහ මහතාගෙන් මේ කරුණ සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමට ඇත්තේ කුමක්දැයි විමසන ලදුව ඒ මහතා විසින් පහත සඳහන් පරිදි ප්‍රකාශ කර ඇත.

ප්‍ර: මේ කරුණ සම්බන්ධයෙන් ගරු අධිකරණයට සැළ කරන්න තිබෙන්නේ කුමක්ද?

පි: මෙම ඉල්ලුම්කරුට සේවයට බඳවා ගන්නා විට එම ශ්‍රේණියට අදාළ ඉහළම වැටුප් තලයේ පිහිටුවලා තිබෙනවා. 1999 වර්ෂයේදී ලබා දුන් වැටුප් වර්ධකයේ කොටස් තුනක් තිබෙනවා. පළවෙනි එක තමයි ස්ථිර වැටුප් වර්ධකයක් ලබාදීම 20% කියන එක ඔහුට ලැබිලා තිබෙනවා. දෙවනි කොටස කාර්යසාධනය සම්බන්ධයෙන් වැටුප් වර්ධකය, ඒකත් ඔහුට ලබාදීලා තිබෙනවා. තුන්වෙනි එක ගැලපීම් සම්බන්ධ වැටුප් වර්ධකය මෙවැනි වැටුප් වර්ධකයක් ලබාදීමට හේතුව වැටුප් තලයේ යම් විෂමතාවයක් තිබෙන විට වැටුප් තලයේ පහළ සිටින සේවකයන්ගේ වැටුප් තළය ඉහළට ඔසවා තැබීම සඳහා තමයි ගැලපීම් වැටුප් වර්ධකය ලබා දෙන්නේ. ඉල්ලුම්කරුගේ ශ්‍රේණිය තුළ ඔහුව ඉහළම වැටුප් තලයේ පිහිටුවා තිබෙනවා. මම කළින් ඉදිරිපත් කළ R6 ලිපියේත් ඒ බව සඳහන් වෙනවා. එම නිසා 20% ගැලපීම් දීමනාව ලබාදීමේ අවශ්‍යතාවයක් තිබුණේ නැහැ.

ඔහුගේ වැටුප EV ශ්‍රේණියේ උපරිමය + පෙට්‍රල් ගැලුම් 30 ප්‍රතිපූරණය අනුව තීරණය වී ඇත. එනිසා ගැලීමේ අවශ්‍යතාවයක් නොමැති බව පැහැදිලිව පෙනී යයි.

වගඋත්තරකරුගේ පළමුවන සාක්ෂිකාරිය වන සාරා මොහොමඩ් මහත්මිය මෙම විසඳනාවට අදාළව අසන ලද ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු පහත පරිදි වේ.

ප්‍ර: දැන් මේ 40% ක ප්‍රතිශතයකින් වැටුප් වැඩි කිරීමට යෝජනා වෙලා ඒක 20% බැගින් අවස්ථා දෙකක දී දෙන්න තීරණය වුණේ ඇයි. ඒ ගැන ඔබට අවබෝධයක් තියෙනවාද?

පි: පොදුවේ කියනවා නම් මේ සේවකයින්ගේ තිබ්බ ගොඩක් ඉංග්‍රීසියෙන් කියනවා නම් සැලරි අනෝමලී කියලා ඒ කියන්නේ වැටුප් විෂමතා. ඒ ප්‍රශ්න තිබුණා ගොඩ දෙනෙකුට තිබුණා. එම ශ්‍රේණියේ එක්කෙනෙකුට වැඩි අනෙත් අයට අඩුයි. සමහරක් අයට සැලරි මැච් කරන්න වෙනවානේ. එහෙම වෙනකොට එයාට එක එක දීමනා දෙනකොට වැඩි වෙන නිසා අරක මානව සම්පත් අංශයෙන් එනවා හැම එක්කෙනාටම 40% ලැබෙන්න විදිහක් නැහැ. එතකොට 40% ලැබෙන කෙනා තවත් ඉස්සරහට යනවා. ඒ කියන්නේ එක එක්කෙනාට ඒ ඒ මට්ටමෙන් තමයි සියයට මෙච්චරයි කියලා ලැබෙන්නේ. ඒ මැච් කරන්න තමයි මේක ගෙනාවා කියලා තමයි මට කියන්න තියෙන්නේ. මට වඩා එච් ආර් එකේ එක්කෙනෙක් විස්තර කියයි.

ඒ අනුව පළවෙනි පක්ෂයට EV ශ්‍රේණියේ ලැබිය යුතු උපරිම වැටුප ලබා දී ඇති බව පෙනී යයි. ඊට අමතරව ආරම්භයේ දී පෙට්‍රල් ගැලුම් 30 ක මුදල ප්‍රතිපූරණය කර ඇත. පසුව රු. 6750/- (පෙට්‍රල් ගැලුම් 30 ක එවකට වටිනාකම) ක මුදල වැටුපට එකතුකර ගෙවා ඇති බව පෙනේ.

එසේම R7 අනුව ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී 9 වන ශ්‍රේණිය සේවකයන් අතර ඉහළම වැටුප ලබමින් සිටි බව සනාථ වේ.

ලබා නොදුන් දෙවන 20% වැටුප් ගැලපීමට අදාළ වන අතර ඔහුගේ ගැලපීම ආරම්භයේදීම සිදු කර ඇති බැවින් එය නැවත ගැලපීමේ අවශ්‍යතාවයක් නැති බව පැහැදිලිව තහවුරු වී ඇත.

ඒ අනුව තුන්වන විසඳනාවට අදාළව කිසිදු අසාධාරණයක් සිදු වී නැති බව තීරණය කරමි. මෙම තීන්දුව සාධාරණ සහ යුක්ති සහගත තීන්දුවක් බවට ද ප්‍රකාශ කරමි.

මීළඟට සළකා බැලිය යුත්තේ හතරවන විසඳනාව පිළිබඳවයි.

එනම් පැමිණිලිකරු සේවයට පැමිණි දින සිට ලබා දුන් රු. 5000/- ක පොරොත්තු දීමනාව (On-Call Allowance) 2011.01.01 දින සිට අහිමි කිරීම යන කරුණු මගින් යම් අසාධාරණයක් සිදුවී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහන කවරේද?'' යන්නත් පිළිබඳව වේ.

පළවන පාර්ශ්වකරුගෙන් දෙවන පක්ෂයේ නීතිඥ මහතා විසින් හරස් ප්‍රශ්න ඇසීමේදී (නඩු ගොනුවේ 103 පිටුව) පහත පරිදි ප්‍රශ්න කර ඇති අතර ඊට ලබා දුන් පිළිතුර ද පහත දැක්වේ.

ප්‍ර: 2011.01.01 දින තමයි තමාට එතෙක් ගෙවමින් සිටි පොරොත්තු දීමනාව නතර කරන්න ආයතනය තීරණය කරලා තිබෙන්නේ?

පි: ආයතනය තීරණය කළාද කියලා මම දැනගෙන හිටියේ නැහැ. වැටුප් වාර්තාවෙන් තමයි මම ඒක දැන ගත්තේ.

එසේම ගොනුවේ 104 වන පිටුවේ තුන් වන ප්‍රශ්නය සහ ඊට අදාළ පිළිතුර පහත පරිදි වේ.

ප්‍ර: තමා දැරුවා කියන විශාල වගකීම් සහගත කටයුත්ත තමා නැතිව කරන්න පුළුවන් බව අවුරුද්දක් තිස්සේ ආයතනය තේරුම් අරගෙන ඉවරයි නේද?

ප්‍ර: ''අපේ ආයතනයේ තියෙනවා එක දෙයක් මතම රඳා පවතින්නේ නැහැ කියලා. ඕනෑම පුද්ගලයෙක් ඕනෑම අවස්ථාවක ඉවත්කරලා ආයතනය පවත්වාගෙන යන්න පුළුවන් වෙන්න ඕනේ. නැත්නම් ආයතනයේ පැවැත්ම රඳා පවතින්නේ නැහැ. හැම කෙනෙක්ම ඒ සඳහා සූදානම් කිරීමක් කරගෙන යනවා. ඒ වගකීම ගනිද්දී එයාට හිමි වැටුප ලබා දෙනවා. වගකීම ගන්නේ නැත්නම් ඒ වැටුප අහිමි කරනවා.'' පළමු පක්ෂයේ එම ප්‍රකාශය අනුවම අහිමිකිරීම සාධාරණ බව පෙනේ.

රූපසිංහ මහතා (පළමු පක්ෂය) කළමනාකාර තනතුරක් දරන පුද්ගලයෙකි. ක්‍රියාකාරී කටයුතු සිදුකරන්නේ පහළ තරාතිරමේ නිලධාරීන් වන අතර එම කාර්ය සඳහා කළමනාකරුවකුගේ අවශ්‍යතාවයක් නැති බව ද සාක්ෂි අනුව තහවුරු වී ඇත. වසර ගණන් වැටුප් රහිත දීර්ඝ නිවාඩු ලබා ගන්නා පුද්ගලයකු පොරොත්තු රාජකාරියක් සඳහා අපේක්ෂා කළ නොහැකි බව ද සාධාරණ පුද්ගලයාගේ සංකල්පයෙන් බලන කල සාධාරණ බවට තීන්දු කළ හැකිය. ඉහත ඔහුගේම ප්‍රකාශය අනුව ''වගකීම ගන්නේ නැත්නම් ඒ වැටුප අහිමි කරනවා'' ඔහු වැටුප් රහිත නිවාඩු ගෙන වගකීම අවස්ථා ගණනාවකදී පැහැර ඇති බව සනාථ වේ.

පළමු පක්ෂය වැටුප් රහිත නිවාඩු ලබාගෙන වසර ගණනින් හෝ මාස ගණනින් විදේශගතව සිටින අවස්ථාවල on call රාජකාරිය කළ පුද්ගලයින් පළමු පක්ෂය නැවත පැමිණි පසුව ඉවත් කර ඔහුට on call ලබා නොදීම අසාධාරණ බවට පළමු පක්ෂය කර ඇති චෝදනාව බැලූ බැල්මටම අසාධාරණ ඉල්ලීමක් බව ඕනෑම සාධාරණ පුද්ගලයකුට පැහැදිලි වේ. ඔහු මෙම ආයතනයේ රාජකාරි කළ කාලය තුළ දීර්ඝ වැටුප් රහිත නිවාඩු ලබා අවස්ථා ගණනාවක්ම රාජකාරියෙන් බැහැරව සිට ඇත.

1. R9 මාස එකයි සති 3 ක නිවාඩු (ආපදා)
2. R11 - 2015.12.30 - 2017.12.29 දක්වා වසර දෙකක් ද
3. R12- ඉල්ලීම මත R13 අනුව මාස 6 ක කාලයක් ද
4. R15 අනුව අනුප්‍රාප්තිකයෙකු සහිතව නිවාඩු ලබා දෙන ලෙස මානව සම්පත් කළමනාකාර තැන විසින් R16 අනුව වැටුප් රහිත නිවාඩු ලබා දීමේ ඇති දුෂ්කරතාවය පැහැදිලිව දක්වා ඇති අතර එම කාලයට අමතර කාර්ය මණ්ඩල සපයා දෙන ලෙසට ද ඉහළ කළමනාකරණයෙන් ඉල්ලා ඇති බවට ද සනාථ වේ.

ඔහු විදේශගතවූ කාලය තුළ ඔහුගේ රාජකාරීන් ද අනුප්‍රාප්තිකයකු රහිතව ලබා දී ඇති බැවින් අන් සේවකයන් මත අමතර රාජකාරි පැටවෙද්දී on call රාජකරිය ද ඔවුන් විසින්ම සිදුකර ඇති බව පෙනේ.

මාස ගණනින් සහ වසර ගණනින් සේවයෙන් බැහැරව වැටුප් රහිත නිවාඩු ලබාගෙන සිට පැමිණි පසුව ඔහුට ඔහුගෙන් ඉවත් වූ අමතර රාජකාරීන් ආපසු පැවරීමේ හැකියාවක් නැති බව ද පෙනී යයි. එසේ කිරීම ඔහු නැති කාලයේ අමතර කැපකිරීම් කළ සේවකයන්ට කරන අසාධාරණ සහ අයුක්ති සහගත කටයුත්තක් බව ද පෙනේ.

ඔහු නොමැති කාලයේ එම කාර්ය කළ අයවලුන් ලවා එම කටයුතු දිගින් දිගටම කර ගැනීම සාධරණ සහ යුක්ති සහගත බව ද පෙනී යයි.

කළමනාකරුවන්ගේ සේවය රාජකාරි කාලයට පමණක් සීමා වන අතර on call රාජකාරිය ඔවුන්ට අයත් කාර්යයක් නොවේ. 2011 දී පැය 24 ම සේවය අනවශ්‍ය අයෙකු ලෙස කළමනාකරණය විසින් පළමු පක්ෂය පිළිබඳව තීන්දු කර ඇත.

කළමණාකරුවන් පොරොත්තු රාජකාරි නොකරන අතර අධීක්ෂණ කටයුතු පමණක් සිදුකරනු ලබන හෙයින් පොරොත්තු රාජකාරි ලබා දෙනු නොලැබේ. පළමු පක්ෂයේම ප්‍රකාශය අනුව ''වගකීම ගන්නේ නැත්නම් ඒක අහිමි කරනවා'' ඔහුගේම ප්‍රකාශය අනුව වගකීම් ගැනීමකින් තොරව දීර්ඝ කාලීන වශයෙන් නිරන්තරයෙන් වැටුප් රහිත නිවාඩු ලබාගැනීම මත පොරොත්තු දීමනාව අහිමි කිරීම සාධාරණ හා යුක්ති සහගත බව පෙනේ. ඔහු වැටුප් රහිත නිවාඩු ගත් කාලය තුළ ඔහුගේ එම කාර්යයන් කළ අය මගින් ම එම කටයුතු දිගින් දිගටම කරගැනීමට හැකියාව තිබියදී වරින් වර වැටුප් රහිත නිවාඩු මත විදෙස් ගතවන අයකු කෙරෙහි විශ්වාසයක් තබා කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බව ද පෙනීයයි. ඒ අනුව නිරතුරුව පොරොත්තු රාජකාරි පමණක් නොව ස්වකීය රාජකාරි වලින් ද ඉවත්ව වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා අයකු පොරොත්තු රාජකාරි සඳහා විශ්වාසයක් තබාගැනීමේ හැකියාවක් නොමැති බව සාධාරණ පුද්ගලයාගේ සංකල්පයෙන් බලන කල පෙනී යයි. R 8 ලේඛනය (E-mail) ඉහල කළමනාකරණය මගින් දෙන ලද උපදෙස් අඩංගු විදුලි තැපෑලෙන් ලද උපදෙසකි. ඉහල කළමනාකරණයේ සිටින පළමු පක්ෂයට පොරොත්තු රාජකාරි ලබාදීම අනවශ්‍ය බවට R 8 ලේඛනය අනුව පැහැදිලිව දක්වා ඇත.

2011 දී පැය 24 ම සේවය අවශ්‍ය නොවන අයකු බවට පළමු පක්ෂය සම්බන්ධයෙන් කළමණාකරණය තීරණය කර ඇත. On call ඉවත් කර ඇත්තේ ඒ අනුවයි. සරා මොහොමඩ්ගේ සාක්ෂියට අනුව “no pay leave ගියහම On call ඉබේම නතරවෙනවා. ආපසු පැමිණියාම නැවත ඉල්ලීමක් නොකලහම දිගටම නොලැබී යන්න ඉඩ තියෙනවා.” (213 පිටුව) ඒ අනුව පළමු පක්ෂය On call රාජකාරි ලබාදෙන ලෙස ඉල්ලීමක් කර නැති බව ද පෙනී යයි. ඒ අනුව පැහැදිලි වන්නේ On call දීමනාව නතර වී ඇත්තේ පළමු පක්ෂයේ ම ක්‍රියාකලාපය හේතුකරගෙන බවත් දෙවන පක්ෂය අසාධාරණ කටයුත්තක් කිරීමෙන් නොවන බවත් පැහැදිලිවම පෙනී යයි.

ඒ අනුව 2, 3, 4 විසඳනාවන්ට අනුව පළමු පක්ෂයට අසාධාරණය හෝ අයුක්ති සහගත කටයුත්තක් දෙවන පාර්ශවය විසින් සිදු කර නැති බව ද, ඉහත සඳහන් කරුණු කාරණා අනුව පළමු පක්ෂයේම ක්‍රියාකලාපය හේතු කරගෙන ඔහුගේ රැකියා භූමිකාව තුළ අපේක්ෂිත සියලුම උසස්වීම්, වැටුප් වර්ධක අහිමි කරගෙන ඇති බවත් දෙවන පක්ෂය පළමු පක්ෂය කෙරෙහි සානුකම්පිතව සහ සාධාරණව දිය හැකි සියලුම පහසුකම් ලබා දී ඇති බවත් ඉහත විස්තර අනුව මොනවට සනාථ වේ.

ඒ අනුව පළමු පක්ෂයට අදාලව කම්කරු කොමසාරිස් ජනරාල්තුමා විසින් ඉදිරිපත් කර ඇති බව 2, 3, 4 විසඳනාවන් අනුව කිසිදු වන්දි මුදලක් ප්‍රදානය කිරීමට අවශ්‍ය නොවන බව ද එම තීරණය සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් බව ද ප්‍රකාශ කරමි.

**වී. ජයරත්න,**
බේරුම්කරු.

2023 ජූලි මස 12 වන දින දී ය.

EOG 08 - 0190

---

මගේ අංකය: IR/COM/03/2020/207.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.01.09 දිනැති හා අංක 2314/03 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.12.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පාදුක්ක, ජයන්ති මාවත, අංක 320/ඊ හි පදිංචි ඩබ්. ජී. නිමල් අත්තනායක මයා සහ කොළඹ 05, කිරුළ පාර, නො. 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 02/2023 හා 2023.07.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

ඩබ්. ජී. නිමල් අත්තනායක,
අංක 320/E,
ජයන්ති මාවත,
පාදුක්ක.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය : A/02/2023.
ගොනු අංකය : IR/COM/03/2020/207

සහ

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
නො. 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

ඉහත දෙපාර්ශ්වය අතර පවත්නා අංක A/02/2023 කාර්මික ආරාවුලට අදාළ ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත පමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඉහත කී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කාරු වශයෙන් හෝකන්දර උතුරු, අරංගල, රණමයුර මාවතේ අංක 453 F දරන ලිපිනයේ පදිංචි විතාරණගේ ජයරත්න වන මා වෙත යොමු කර ඇත.

එකී යොමු කිරීමට යාකර ඇති කම්කරු කොමසාරිස් ජෙනරාල් තැනගේ IR/COM/03/2020/207 සහ 2022.12.16 දිනැති ලිපිය අනුව එකි කාර්මික ආරාවුලට හේතු පාදක වී ඇති කරුණු වනුයේ "ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ රියදුරෙකු ලෙස 1993.07.11 දින සිට සේවය කරමින් සිටියදී ඇති වූ අනතුරක් සම්බන්ධව පැවති විනය පරීක්ෂණ අවසන් වීමට පෙර 2003.03.26 දින විදේශගතවීම හේතුවෙන් සේවය හැරගියා සේ සලකා අභියාචනා කිරීමෙන් අනතුරුව 2007.03.12 දිනැති ලිපියෙන් කොන්ත්‍රාත් සේවයෙකු ලෙස පත්කර ඇති ඩබ්. ජී. නිමල් අත්තනායක මහතාට,

- නැවත පත්වීම ලද පසු විනය පරීක්ෂණයක් සිදුකිරීම.
- විනය පරීක්ෂණය අවසානයේ දඬුවම් ලෙස 2014.12.01 දින සිට 2015.04.30 දක්වා සේවය අත්හිටුවීම සහ,
- එම කාලයට වැටුප් අහිමි කිරීම මගින්

අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් 1993.05.11 දින සිට මේ දක්වා අඛන්ඩ සේවා කාලයක් පවතින සේ සැලකිය හැකියද යන්නත් පිළිබඳව වේ." යනුවෙන් සඳහන් කර ඇත.

මෙම බේරුම්කරණයට අදාළව 2023.01.13 දිනැති පළමු පක්ෂයේ මුල් ප්‍රකාශය ගොනු කර ඇති අතර ඒ සමග X1 සිට X10 දක්වා ලේඛනද ගොනු කර ඇති බව නිරීක්ෂණය කරමි.

දෙවන පක්ෂය 2023.02.23 දිනැතිව සිය පළමු ප්‍රකාශය පිළිතුරු ප්‍රකාශයක් වශයෙන් නීතිඥ දිමුතු පනංගල මහත්මිය මගින් පළමු පක්ෂයේ පළමු ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින් තම ප්‍රකාශය ඉදිරිපත් කර ඇති බව පෙනී යයි. එහිදී පළමු පක්ෂයේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලෙසටද මෙම පරීක්ෂණය නිෂ්ප්‍රභා කරන ලෙසටද අයදුම් කර ඇත.

කෙසේ වෙතත් පළමු පක්ෂය මහේස්ත්‍රාත් අධිකරණ නඩුව අවසන් වීමෙන් පසුව ආයතනයේ පැවති විනය පරීක්ෂණය අවසන් වීමට පෙර 2003.03.26 දින විදේශගතවීම හේතුවෙන් සේවය හැරගිය සේවකයෙකු වශයෙන් සලකා ඇති අතර නැවත පැමිණ කරන ලද අභියාචනය අනුව 2007.03.12 දින සිට කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයෙකු වශයෙන් පත්වීමක් ලබාදී ඇති අතර ඉහත යොමුවට අනුව විනය පරීක්ෂණයේ තීන්දුවට අනුකූලව මාස 5ක වැටුපප අහිමි කිරීම තුලින් මෙම නඩුවේ මූලික විසඳනා තුනම උද්ගතවී ඇති බව පෙනේ.

පළමු පක්ෂය පරීක්ෂණයේදී ප්‍රකාශ කර සිටියේ සේවා අඛන්ඩතාවයකින් තොරව මෙම දඬුවම ලබාදීම අසාධාරණ වන අතර නවක සේවකයෙකු වශයෙන් සේවයට බඳවාගෙන ඇති හෙයින් එම පරීක්ෂණය සහ ලබාදුන් දඬුවම අසාධාරණ සහ අයුක්ති සහගත බවයි.

පළමු පක්ෂය 2003.03.20 දින විදේශගත වී සිට 2006.11.15 දින ආපසු පැමිණි පසු නැවත සේවයට ගොස් ඇති අතර දෙවන පක්ෂය රැකියාව ලබාදී නැති බව පළමු පක්ෂය කියා සිටී. කෙසේ වෙතත් 2007.03.12 දින සිට කොන්ත්‍රාත් පදනම මත නව පත්වීමක් ලබාදී ඇති අතර ඒ අනුව ඔහුගේ පූර්ව රැකියා කාලයට අදාළව විනය ක්‍රියාමාර්ග ගැනීම අසාධාරණ බව පළමු පක්ෂයේ ස්ථාවරයයි.

කෙසේ වෙතත් 2023.04.03 වන දින දෙවන පක්ෂයේ නීති නිලධාරිනි දිමුතු පනංගල මහත්මිය ආයතනයේ නීති අංශයේ පරිපාලන නිලධාරිනී ග්‍රේටා රෝසස් මහත්මිය සහග පෙනී සිටිමින් ප්‍රකාශ කළේ,

"මෙම නඩුව පූර්ණ සහ අවසන් සමතයක් වශයෙන් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් පළමු පාර්ශවයට 2014.12.01 දින සිට 2015.04.30 දක්වා වූ නොගෙවූ මුදල රුපියල් 24,750.00 x 5 = 123, 750.00 ක මුදල මාසයක් තුළ එනම් මෙම නඩුව කැඳවන ඊළග දින ගෙවීම් කිරීමට එකඟ වේ" යනුවෙනි.

ඒ අනුව පළමු පාර්ශවයේ පළමු සමථ යෝජනාව වන අඛණ්ඩ සේවා කාලය යන්න ප්‍රතික්ෂේප කිරීමට දෙපාර්ශවයම එකඟ වී ඇති බව කියා සිටී. එම අවස්ථාවේදී පළමු පක්ෂය අධිහාරය පිළිබඳව විමසන ලද අතර අධිහාර ගෙවීමක් කල නොහැකි බව ප්‍රකාශ කර එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නට යෙදුනි. ඒ අනුව පළමු පාර්ශ්වය විසින් අධිහාරය අතහැර සමාදානයට එකඟතාවය ප්‍රකාශ කරන ලද අතර බේරුම්කරණය මගින්ද එකී සමථය සාධාරණ සහ යුක්තිසහගත සමථයක් වශයෙන් තීරණය කරන්නට යෙදුනි. ඒ අනුව මාසයක් ඇතුළත එම මුදල ලබාදීමට දෙවන පක්ෂයත් ලබාගැනීමට පළමු පක්ෂයත් එකඟව 2023.05.10 වන දින 2023.07.13 දිනැති රුපියල් 123,750.00 ක් වටිනාකම සඳහන් අංක 258639 දරන මහජන බැංකුවේ යූනියන් පෙදෙස ශාඛාවේ චෙක්පත බේරුම්කරණයේදී ලබාදී මෙම බේරුම්කරණ පරීක්ෂණය දෙපක්ෂයේ පූර්ණ එකඟතාවය මත අවසන් කරන්නට යෙදුනි. මෙම සමථය පූර්ණ සහ අවසන් මෙන්ම සාධාරණ සහ යුක්තිසහගත සමථයක් බවටද ප්‍රකාශ කරමි.

**විතාරණගේ ජයරත්න,**
බේරුම්කරු.

2023 ජූලි මස 24 වැනි දින දී ය.

EOG 08 - 0191

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.